සබරගමුව පළාත.
දෙහිඕවිට අධ්‍යාපන කලාපය.
එම්.ජී.ප්‍රේමශාන්ත-ගුරු උපදේශක.
5 ශ්‍රේණිය
මව්බස.

# මව්බස වාංමාලා පෝෂණය

## (1)ක්‍රියාකාරකම.

5 ශ්‍රේණිය කියවීම් පොතේ ඇතුළත් කැලෑවේ අන්තර් ජාලය පාඩම කියවන්න.

## පියවර 2.

පාඩමේ ඇති පහත වචන සඳහා යෙදුණු නිවැරදි අකුරු තෝරන්න.

(1)බුද්_මත් (දි/ධි)
(2)වි_ල (සා/ශා)
(3).පරිග_ක (න/ණ)
(4).කාර්යක්_ම (ශ/ෂ)
(5).සාකච්_ (චා/ඡා)
(6).කෘත_ (ඥ/ඦ)
(7).සමෘද්_මත් (ධි/දි)
(8).ප්‍රතිසංස්කර_ ය(න/ණ)

## පියවර 3.

නිවැරදි කළ වචන ශබ්ද නගා කියවන්න.

## පියවර 4.

ඔබ කියවූ වචන පහක් තෝරා ගෙන ඒවා වාක්‍යවල යොදන්න.

උදා:- 1. කන්ද පාමුල විශාල ගල් පර්වතයක් විය.
2.ළමයා බුද්ධිමත් ව කටයුතු කිරීමෙන් අනතුරින් බේරුණේ ය.
3.........................................................................
4.........................................................................
5.........................................................................
6.........................................................................
7.........................................................................

## (2).ක්‍රියාකාරකම

### පියවර 1.

පහත තේරවිලි තෝරන්න.

1. නැට්ට නැති ගෙඩිය.
2. අලියානොකන දල්ල.
3. කපන්න කපන්න දික් වෙයි.
4. පංචි ළිදේ වතුර රසයි.
5. බෝතලයට දැමිය නොහැකි පැනිය.
6. ලෝකය දකියි තමාව නොපෙනෙයි.

| | |
|---|---|
| බිත්තරය | ගිනිදැල්ල |
| පාර | ඇස |
| තැඹිලි ගෙඩිය | කම්පැනිය. |

පියවර 2.

පහත තුන් තේරවිලි පවුලේ සාමාජිකයින් සමඟ තේරීමට උත්සාහ කරන්න.

උදා;-චන්දි මුදල | චන්දි නම් දඩ
--- | ---
| මුදල නම් කාසි
| දඩ කාසි -කඩදාසි

1. බුදු කුස්සිය.
2. කෝටු ඉලක්කෙ
3. අහස් රිට.
4. ගජ නාලය.
5. කුඹුරෙ නයා.
6. තිහයි තිහයි ඔළුවට එකයි.

පැණි මුල | මරදාන
--- | ---
පලවෙනිදා | කොටයි හැට්ටෙ
ඉගෙන ගන්න | බත් ඇටය

# පහත තේරවිලි ගායනා කරන්න.

සත් සමුදුරේ දිය පල්ලේ උපන්නේ
එම සමුදුරේ දිය මතු පිට පිපෙන්නේ
වැස්සට පිනි බබා නිතරම මෝරන්නේ
අද බැරිනම් හෙට තෝරා එවන්නේ

සත් සමුදුරේ දිය පල්ලේ තිබෙයි අල
එම සමුදුරේ දිය මතුපිට තිබෙයි කොළ
වැස්සට පිනි බබා මෝරන කැකුළළු මල
මස්තකයින්ට මුතු කුඩයකි කැකුළු මල

උඩින් දුවන වී තෝරා එවාපන්
බිමින් දුවන වී තෝරා එවාපන්
ගෙදර සිටින වී තෝරා එවාපන්
වෙල්වල පැසෙන වී තෝරා එවාපන්

උඩින් දුවන වී ගිරවී නොවේදෝ
බිමින් දුවන වී සාවී නොවේදෝ
ගෙදර සිටින වී පරෙවී නොවේදෝ
වෙලේ සිටින වී මාවී නොවේදෝ

# (3).ක්‍රියාකාරකම

සමානාර්ථ පද,විරුද්ධාර්ථ පද,යුගල පද,ප්‍රස්තාව පිරුළු,ඉඟි වැකි හා ආප්තෝපදේශ නිවැරදිව අර්ථ දැක්වීම සඳහා භාවිත කරයි.

## පියවර 1

පහත වගන්ති ශබ්ද නගා කියවන්න.

1.රාත්‍රිය සඳහා සකසන ආහාර එම රැය ගෙවී යත් ම බොහෝවිට නරක්වන බව අපි දනිමු.

2.අලුත් අවුරුද්ද ලබන විට සෑම වසරක ම ගස් වැල් මලින් බර වේ.

3.වචන වල තේරුම මෙන්ම වාක්‍යක අර්ථය ගැනද අප අවබෝධ කර ගත යුතුය.

4.අපි නෙලුම් මල් ගෙනවිත් එම සියපත් බුදුහිමි උදෙසා පූජා කළෙමු.

5.ප්‍රසිද්ධ පුවත් පතක ප්‍රකට පුද්ගලයකු පිළිබඳ තොරතුරු රාශියක් තිබුණි.

## පියවර 2

ඔබ කියවූ එක් එක් වාක්‍ය වල සමානාර්ථ පද දෙක බැගින් සොයා අභ්‍යාස පොතේ ලියන්න.

## පියවර 3

ඔබ ලියූ සමානාර්ථ පද සමග සසඳා බලන්න.

| | | |
|---|---|---|
| රාත්‍රිය | = | රෑය |
| අවුරුද්ද | = | වසර |
| අර්ථය | = | තේරුම |
| නෙලුම් මල | = | සියපත |
| ප්‍රසිද්ධ | = | ප්‍රකට |

## පියවර 4

ඉහත කොටුවේ සඳහන් සමානාර්ථ පද ශබ්ද නගා කියවන්න.

## පියවර 5

ඉරි ඇඳි පදයට සමානාර්ථ පදය යොදා වාක්‍යයක් ගොඩ නගන්න.

උදා:- 1.රාත්‍රියට නිවෙස්වල පහන් දල්වයි.
නිශාචර සත්ත්‍ව රෑයට ආහාර සොයා යති.

2.සෑම අවුරුද්දකම අප උනන්දුවෙන් වැඩ කළ යුතුය.

.....................................................................................

3.එම කවියේ අර්ථය ගැන මම බොහෝ සතුටු වුණෙමි.

.....................................................................................

4.නෙලුම් මල් පිපුණු වැව අලංකාරව පෙනේ.

.....................................................................................

5.කුඩා හොරා පොත ලෝක ප්‍රසිද්ධ විය.

.....................................................................................

# (4).ක්‍රියාකාරකම

## පියවර 1

පහත කොටස කියවන්න.

මේ දිනවල සිසුන්ගේ පැමිණී ම ඉතා හොඳ මට්ටමක පවතියි.සමහර සිසුන්ගේ නොපැමිණී ම ගැන මම අද සිට සොයා බලමි.එම සිසුන් සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමි.කිසි ම කෙනෙකු අනවශ්‍ය කටයුතුවල නිරත නොවිය යුතු ය.

සෑම දෙනෙක්ම සංගීතය හෝ නැටුම් පුහුණු විය යුතුය. මෙතෙක් පුහුණුව නොලැබූ නුපුහුණු දරුවන් වඩාත් උනන්දු විය යුතුය.සෑම දරුවෙකුම තමාගේ වැරදි හා අඩුපාඩු නිවැරදි කර ගෙන ඉදිරි කටයුතු සාර්ථක කර ගත යුතුයි.අලුත් වැඩසටහන පිළිබඳව සෑම දරුවෙකුම පාසලේ පරණ ගුරුභවතුන්ගෙන් විමසා කටයුතු කළ යුතුයි.

## පියවර 2

රතු පැහැයෙන් දැක්වෙන වචන ශබ්ද නගා කියවන්න.

## පියවර 3

රතු පැහැයෙන් දැක්වෙන වචන අභ්‍යාස පොතේ පහළට ලියන්න.
ඒවාට විරුද්ධාර්ථ පද ඉදිරියෙන් සොයා ලියන්න.

## පියවර 4

ඔබ ලියූ විරුද්ධාර්ථ පද ශබ්ද නගා කියවන්න.

## පියවර 5

කොටුවේ ලියූ විරුද්ධාර්ථ පද සමඟ ඔබ ලියූ පද සසඳා බලන්න.

| | | |
|---|---|---|
| පැමිණීම | - | නොපැමිණීම |
| අවශ්‍ය | - | අනවශ්‍ය |
| පුහුණු | - | නුපුහුණු |
| වැරදි | - | නිවැරදි |
| අලුත් | - | පරණ |

## පියවර 6

නිල් පැහැයෙන් දැක්වෙන වචනයට විරුද්ධාර්ථ පදය යොදා වාක්‍යය නැවත ලියන්න.

1.දිනපතා පාසල් පැමිණීම හොඳ පුරුද්දකි.

දිනපතා පාසල් නොපැමිණීම නරක පුරුද්දකි.

2.උත්සවයේ අවශ්‍ය වියදම් සොයා බැලුවෙමි.

.....................................................................

3.එම කම්හලට පුහුණු සේවකයින් අවශ්‍ය වේ.

.....................................................................

4.වැරදි ලෙස වැඩ කිරීමෙන් සතුට නැතිවෙයි.

.....................................................................

5.අපි අලුත් පොත් පුස්තකාලයට භාර දුනිමු.

.....................................................................

# (5).ක්‍රියාකාරකම

## පියවර 1

පහත කවි ගායනා කරන්න.

අනම් මනම් කතා හොඳ නැතේ
විහිළු තහළු නිතර හොඳ නැතේ
අස්සක් මුල්ලක් නෑර මගෙ පුතේ
පිරිසිදු කර වැඩ කරමු පුතේ

අරුම පුදුම දේ මැවෙයි සිතේ
වාද විවාද ඒ ගැනද පුතේ
හොඳ දේ තෝරන්න මගෙ පුතේ
ඉන් දිවි මඟ එළිය වෙයි පුතේ

## පියවර 2

රතු පාටින් යෙදූ වචන ශබ්ද නගා කියවන්න.

## පියවර 3

එම යුගල පද අභ්‍යාස පොතේ ලියන්න.

## පියවර 4

පිටපත් කරගෙන යා කරන්න.

| | |
|---|---|
| අනම් | පුදුම |
| විහිළු | විවාද |
| වාද | මුල්ලක් |
| අරුම | මනම් |
| අස්සක් | තහළු |

## පියවර 5

ඔබ ලියූ යුගල පද නිවැරදිද බලන්න.
ශබ්ද නගා කියවන්න.

| | |
|---|---|
| අනම් | මනම් |
| විහිළු | තහළු |
| වාද | විවාද |
| අරුම | පුදුම |
| අස්සක් | මුලුලක් |

## පියවර 6

කොටුවේ සඳහන් යුගල පද යොදා වාක්‍යය 5 ක් ලියන්න.

# (6).ක්‍රියාකාරකම

පියවර 1

පහත ප්‍රකාශ කියවන්න.

1.දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

2.ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

3.යමක් කිරීමට උත්සාහ කර එය කරගත නොහැකි විට එහි අගුණ කීම.

4.සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම.

5.අදූරදර්ශී උපදෙස් දීම.

පියවර 2.

ඉහත ප්‍රකාශ වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

අංක නිවැරදිව යොදන්න.

1.නරියා මිදි තිත්තයි කිවුවා වගේ

2.ගඟට ඉනි කැපුවා වගේ

3.මහදැන මුත්තාගේ නුවණ වගේ

4.රයිගමයයි ගම්පලයයි වගේ

5.කට නිසා ඉබ්බා නැහුණා වගේ

පියවර 3.

ඔබේ පිළිතුර සසඳන්න.

| | |
|---|---|
| 1 | 3 |
| 2 | 1 |
| 3 | 5 |
| 4 | 2 |
| 5 | 4 |

පියවර 4.

පහත ප්‍රකාශ පිටපත් කරගෙන ගැළපෙන ප්‍රස්තාව පිරුළු තෝරා ලියන්න.

1.බොහෝ වෙහෙස මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.........................................................................

2.එක සමාන ගති ගුණ මෙන්ම අදහස් දරන පුද්ගලයන් දෙදෙනෙකු අමතා කිව හැකිය.......................................

3.යමක් කිරීමට ගත් උත්සාහය අසාර්ථක වීම නිසා එයට දොස් කීම...........................................................................

4.සුදුසු සුථානය හා වේලාව නොතකා යම් යම් දේ කීමෙන් අමාරුවේ වැටීම.......................................................................

5.දුරදිග නොබලා අනුවණ තීරණ ලබා දීම.

.................................................................................................

1.මහදැන මුත්තාගේ නුවණ වගේ
2.රයිගමයයි ගම්පලයයි වගේ
3.ගඟට ඉනි කැපුවා වගේ
4.නරියා මිදි තිත්තයි කිවුවා වගේ
5.කට නිසා ඉබ්බා නැහුණා වගේ